# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1902/42 - 2015 පෙබරවාරි මස 18 වැනි බදාදා - 2015.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු මැද පළාතේ පළාත් සභාව

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (1) වැනි වගන්තිය යටතේ නිවේදනය**

එවකට උතුරු මැද පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, පළාත් වාරිමාර්ග, පළාත් ඉඩම්, පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම්, ක්‍රීඩා හා යෞවන කටයුතු පිළිබඳ අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ රංජිත් සමරකෝන් මහතා විසින්, දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ සභාපති සිංහලගේ ජගත් සමරවික්‍රම මහතා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (1) වැනි වගන්තියේ සඳහන් වරදවල් එකක් හෝ කීපයක් හෝ සියල්ලම සිදුකර ඇති බවට සෑහීමට පත්වනු පිණිස 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (2) වැනි වගන්තිය අනුව පත් කරනු ලැබූ, විශ්‍රාමලත් අධිකරණ නිලධාරියා වූ කේ. සුනිල් පෙරේරා මහතාගේ පරීක්ෂණ වාර්තාව මා වෙත ලැබී ඇත. එකී පරීක්ෂණ වාර්තාව අනුව දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ සභාපති සිංහලගේ ජගත් සමරවික්‍රම මහතා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (1) වැනි වගන්තිය අනුව වරදවල් කර ඇති බවට සනාථ වී ඇති බැවින් සහ ඒ පිළිබඳව සෑහීමට පත්වීමෙන් අනතුරුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (1) i සහ ii වන වගන්ති අනුව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරු මැද පළාත් සභාවේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වන සිංහලගේ ජගත් සමරවික්‍රම මහතා එකී සභාපති ධූරයෙන් සහ සභික ධූරයෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ඉවත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

සුදසිංහ මුදියන්සේලාගේ පේශල ජයරත්න බංඩාර,
උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය සහ උතුරු මැද පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන,
පළාත් පාලන, පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක,
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2015 පෙබරවාරි මස 18 වන දින,
ප්‍රධාන අමාත්‍යාංශය,
උතුරු මැද පළාත් කාර්යාලයේ දී ය.

03 - 110


1A - PG 2373 — 25 (2015/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*